# බුදු දහමේ දැක්වෙන උපමා

ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක

**කහටවිල පියරතන හිමි**

බෞද්ධ සාහිත්‍යය අව්‍යාජ අර්ථාන්විත සාරගර්භ විවිධ උපමාවලින් පරිපෝෂිත වූවකැයි විශ්වකීර්තියට පත් විද්වත්හු පිළිගනිති. බුදුරජාණන් වහන්සේ මෙතෙක් මිහිපිට පහළ වූ අසදෘශ ශ්‍රේෂ්ඨ සාහිත්‍යධරයාණෝ වූහ. අති ගැඹුරු නිර්වාණ ධාතුව පසක්කළ ගොයුම් ගොත් හිමිහු සිය සියුම් දහම් දැනුම වෛනෙය ජනයාට ලබාදෙනු වස් බෙහෙවින්ම උපමාවලින් පරිපූර්ණ වාග් මාලාවක් අනුගමනය කළසේක.

ත්‍රිපිටක පාළි සාහිත්‍යය හොඳින් පරිශීලනය කරන්නකුට ඒ බව දැකිය හැකිය. බුද්ධ ධර්මය අනුක්‍රමයෙන් ගැඹුරුය. එමෙන්ම අතිශයින් විසිතුරුය. බුද්ධිගෝචර ධර්මයක් වන්නේ එහෙයිනි.

බුදුරදුන් බුද්ධත්වයට පැමිණි පසු කෙලෙස් රජසින් පිරුණු පිරිසට දහම් දෙසීමට මන්දෝත්සාහී වන්නට ඇත්තේද ධර්ම ගම්භීරත්වය සිතීමෙන් විය යුතුය. කෙසේ වුවත් අල්ප රජස්ක පුද්ගලයන්ද ඇති බව දුටු උන්වහන්සේ දහම් දෙසූ සේක. තථාගතයන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් දානාදි සමතිස් පෙරුම් දම් පිරීමෙන් සවන් නැණ පසක් කළේ දුකින් පෙළෙන සතුන්ගේ උභය ලොකාර්ථ සිද්ධිය සඳහාමය. ඔවුනට එම සද්ධර්මය ලබාදීමට ඔවුන්ගේ සිත්තුල සදහම් එළිය දැල්විය යුතුය.

ඒ අනුව මිනිසාගේ දෛනික ජීවිතයට ඉතාම සමීප සබඳකම් ඇති අවස්ථා හා උපමා ආශ්‍රිතව දහම් දෙසීමේ ක්‍රමය උන්වහන්සේ අනුගමනය කර තිබෙන බව බෞද්ධ සාහිත්‍යයේ පැහැදිලිවම දක්නට ලැබේ. ධම්මපදයේ නිර්දිෂ්ට උපමා ඉතාම අර්ථවත්ය, උචිතය.

සෙවිලි කළ ගෙයකත් සෙවිලි නොකළ ගෙයකත් ස්වභාවය උපමා කර දෙසූ දහම් විස්තරය අසිරිමත්ය.

'' යථාගාරං දුච්ඡන්නං
වුට්ඨී සමතිවිජ්ඣති
එවං අභාවිතං චිත්තං
රාගො සමතිවිජ්ඣති ''

'' යථාගාරං සුච්ඡන්නං
වුට්ඨී නසමති විජ්ඣති
එවං සුභාවිතං චිත්තං
රාගො න සමති විජ්ඣති.''

(ධම්ම පද යමක වග්ග)

ථෙරී ගාථාවල දක්නට ලැබෙන උපමා තාත්විකත්වයෙන් පරිපූර්ණය.

'' උපසන්තොහි තෙ රාගො සුක්ඛවාකංව කුම්භියා ''

'' උඳුන මත තැබූ පලා මැලවෙන්නාක් මෙන් ඔබේ රාගය සංසිඳුනේය.''

(ථෙරී ගාථා 1)

කෘෂිකාර්මික ජීවිතය ඇසුරෙන් අංගුත්තර නිකායේ සම්මාපණිහිත සූත්‍රයේ එන උපමාද වැදගත්ය.

'' සෙය්‍යථාපි භික්ඛවෙ සාලිසූකංවා යවසූකංවා සම්මා පණිහිතං හත්ථෙන වා පාදෙන වා අක්කන්තං හත්ථං වා පාදංවා භෙජ්ජති ලොහිතංවා උප්පාදෙස්සතීති ඨානමෙතං විජ්ජති තංකිස්ස හේතු.''

යන්න උදාහරණයි.

"මහණෙනි, ඇල්වී නණ්ඩුවක් හෝ යව වී නණ්ඩුවක් හෝ ඇණෙන පරිදි අග උඩුකුරු කොට තබන ලදුව අතින් හෝ පයින් හෝ මඩනා ලද්දේ අත හෝ පය හිල් වෙයි. ලේ වැගිරෙයි."

සාගරය උපමා කළ ධර්මදේශනා බෞද්ධ සාහිත්‍යයේ බහුලය. සාගරය ගැඹුරුය. අපාරය. එහි ජලය මතුපිට සැඩ වුවද එහි ගැඹුරට යත්ම නිසලය. සාගර පත්ලෙහි රුවන් වර්ග සැඟවී තිබේ. මුහුදට ගලායන ගංගා ජලය ලවණ ජලය හා එකතු වී එකම රසයෙන් යුක්ත වේ. සස්නට නොයෙක් කුලවලින් පිවිසුණද ශාක්‍යපුත්‍ර නාමයෙන්ම සලකනු ලබති. මෙහිදී බුදුසසුන සාගරයක පවත්නා ස්වභාවය දරයි. ප්‍රඥව – ධර්මය – සසර වැනි ඉතා ගැඹුරු පදර්ථයන්ද අපාරවූ සාගරයට සම කර ඇත.

බුදු ගුණ වණන කවියා බුද්ධ ගුණය මහ සයුරකට උපමා කරයි. දුක – මෝහය අඳුරට උපමා කර ඇත.

බුදු හිමියන්ගේ කරුණාව හා මෛත්‍රිය අමා ගඟකි. ගඟෙහි පියුම් පිපේ. විකසිත පියුම පූර්ණ පිනැත්තකු හඳුන්වන අපූරු සංකේතයකි. නෙළුම් පුබුදුව සත්‍යය වටහා ගැනීම බඳුය. සමහර නෙළුම් දිය මතු පිටට එන්නට පෙර නොයෙක් උවදුරු නිසා වැනසෙන්නාසේ පිං නොමේරූ පුද්ගලයෝ නොකල්හි මඟපල නොලබති. සසර සාගරය තරණය කිරීමට ධර්මය පහුරක් වශයෙන් දක්වා ඇත. එතෙර වූ පසු පහුර කර ගසාගෙන නොයන්නා සේ ධර්මය ද අල්වා නොගත යුතුය.

කුල්ලූපමං වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි නිස්සරණත්ථාය නො ගහණත්ථාය යනුවෙන් එය පැහැදිලි කර දී ඇත. බුදු දහම අවශ්‍ය වනුයේ සසර සාගරයෙන් එතෙරවීම සඳහාය.

මෙසේ සිය ගණනින් දැක්විය හැකි උපමා ත්‍රිපිටක සාහිත්‍යයේ දක්නට ඇත.